මගේ අංකය / எனது இல. / My No. } RG/01/එක්දිනසේවා

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 2889488 / 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk / rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2019.03.25

53 149

දෙපාර්තමේන්තු චක්‍ර ලේඛන අංක - 08/2019

සියලුම කලාපභාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරු සහ
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කඩිනම් සේවාව</u>

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/PAD/162/F&C/CO හා 2019.03.13 දිනැති ලිපිය අවලංගු කර එකී දෙපාර්තමේන්තුවේ අංක PFD/PAD/102/F&C/CO හා 2019.03.22 දිනැති ලිපිය මගින් 'කඩිනම් සේවාව' සම්බන්ධව සේවා ගාස්තු ඇමුණුම 1 හි සඳහන් පරිදි සංශෝධනය කර අයකිරීමට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් අනුමත කර ඇති බව දන්වා ඇත.

02. ඒ අනුව ලේඛන ලියාපදිංචි කිරීමේ කාර්යයන්ද, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයන්ද, ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ කාර්යයන් හා ඊට අදාළ සහතික පිටපත් නිකුත් කිරීම සිදු කළ යුතු අතර, එක් එක් පනත් හා අණපනත් වලට අදාළ වන ලෙස ක්‍රියාකිරීමට බලය ඔබ වෙත පවරන අතර පහත සඳහන් උපදෙස් අනුව ද ක්‍රියාකරන ලෙස දන්වමි.

ලේඛන ලියාපදිංචි කිරීම

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල වලට පවතින කාර්යයන් හා ප්‍රමාණය පදනම් කර ගනිමින් ලියාපදිංචි කිරීමේ කාර්යාල කණ්ඩායම් A සහ කණ්ඩායම් B ලෙස වර්ගීකරණය කිරීමේදී වාර්ෂික ලියාපදිංචිය සඳහා ලේඛන 20,000කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබෙන කාර්යාල A වශයෙන්ද වාර්ෂිකව ලේඛන 20,000කට වඩා අඩු සංඛ්‍යාවක් ලැබෙන කාර්යාල B වශයෙන්ද හඳුනා ගන්නා ලදී. (වර්ගීකරණය සඳහා 2018 පාලන වාර්තාව අනුව ඔබ අයත් වන වර්ගීකරණ තත්වය අනුව කටයුතු කරන්න.)

**01.** මෙහිදී කණ්ඩායම් A වශයෙන් ලියාපදිංචිය සඳහා කඩිනම් සේවා යටතේ ලැබෙන ලේඛන පැය 24ක් තුළදී ලියාපදිංචිය කළ යුතු අතර, සාමාන්‍ය සේවා යටතේ ලියාපදිංචිය සඳහා ලැබෙන ලේඛන බාරදුන් දිනයේ සිට දින 05කට පසුව එළඹෙන දින සිට වැඩකරන දින 14ක් ඇතුළත පූර්වතාවය අනුවම අත්සන් කර ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ නිකුත්කිරීම කල යුතුය. සාමාන්‍ය සේවා යටතේ ලැබෙන ඔප්පු අදාළ දිනට තැපැල් කිරීමේ වගකීම ඉඩම් රෙජිස්ට්‍රාර් සතුය.

**02.** කණ්ඩායම් B වශයෙන් හඳුනාගන්නා ලද කාර්යාල වාර්ෂිකව ලියාපදිංචිය සඳහා ලැබෙන ලේඛන 20,000ට අඩු වශයෙන් නම්කර ඇති අතර කඩිනම් සේවාව යටතේ භාරගනු ලබන ලේඛන පැය 24ක් තුළදී ලියාපදිංචි කළ යුතුය. සාමාන්‍ය සේවා යටතේ එම කාර්යාල වලට ලැබෙන ලේඛන භාරදෙන දිනයේ සිට දින 03කට පසුව එළඹෙන දින සිට වැඩ කරන දින 7ක් ඇතුළත පූර්වතාවය අනුවම අත්සන් කර ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ නිකුත්කිරීම කල යුතුය. සාමාන්‍ය සේවා යටතේ ලැබෙන ඔප්පු අදාළ දිනට තැපැල් කිරීමේ වගකීම ඉඩම් රෙජිස්ට්‍රාර් සතුය. ( ලේඛන ලියාපදිංචි පනතේ 7වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කරමි)

**03.** සාමාන්‍ය සේවා යටතේ නිසි පරිදි ලියාපදිංචිකල ඔප්පු නියමිත දිනට පසු අදාල රිසිට් පත්‍රය පරීක්ෂාකර ඔප්පු නිකුත්කිරීමේ කවුළුවෙන්ද ලබාදීම හෝ තැපැල් කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අභිමතය අනුව සිදුකළ හැක. කඩිනම් සේවා ලියාපදිංචිය පැය 24ක් තුලදී සිදුකරනු ලබන අතර පෙරවරු 09.00 සිට 12.00 දක්වා භාරගැනීම සිදු කළ හැකිය. සේවයේ අවශ්‍යතාවය මත ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය යටතේ පස්වරු 12.00 සිට 3.00 දක්වා ඉල්ලුම් කරන අවස්ථාවේදී පසුදින ලියාපදිංචිය ඉටු කිරීම කළ හැකිය.

**04.** ලේඛන ලියාපදිංචිය පනත, නොතාරිස් පනත, මුද්දර ගාස්තු ආඥා පනත හා ලියාපදිංචියට අදාළ සෙසු පනත් වලට අදාළව කටයුතු කළ යුතුය.

**05.** කඩිනම් සේවා අයදුම්පත සමඟ අදාළ ලියාපදිංචි ලේඛනය කාර්යාලය වෙත භාරදිය යුතු අතර ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතියෙන් පසුව ලියාපදිංචි කළ යුතුය.

06. කඩිනම් සේවා යටතේ භාරගන්නා සියලුම ලේඛනවල හා ඒ සඳහා නිකුත් කරන මුදල් කුවිතාන්සිවල කඩිනම් සේවා මුද්‍රාව හා දිනය සටහන් කළ යුතුය.

07. මුදල් අයකිරීම සම්බන්ධයෙන් ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න. (එක් එක් ගෙවීම සඳහා ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න.)

08. සාමාන්‍ය සේවා යටතේ භාරදෙන ලද ලේඛනයක් වුවද සේවාලාභියාගේ අවශ්‍යතාවය මත ඉතිරි මුදල (කඩිනම් සේවා ගාස්තුවෙන් සාමාන්‍ය සේවා ගාස්තුව අඩුකර) ගෙවා කඩිනම් සේවාව යටතේ ලියාපදිංචි කරගත හැකිය.

**පත්තිරු පිටපත්, ඔප්පු පිටපත්, ඇටෝර්නි බලපත්‍ර පිටපත්, හිමිකම් සහතික පිටපත් නිකුත් කිරීම**

01. ~~කඩිනම් සේවා හා සාමාන්‍ය සේවා යටතේ අයදුම්පත භාරදීමේදී වෙන වෙනම අයදුම්පත්~~ භාරගැනීමේ ලේඛන හා කුවිතාන්සි පොත් පවත්වා ගෙනයාම.

02. කඩිනම් සේවා අයදුම්පත පෙ.ව. 9.00 සිට 12.00 දක්වා භාර ගැනීම සිදුකළ යුතු අතර, සියලු පිටපත් එදිනම ලබාදිය යුතුය. සහකාර රෙජිසට්‍රාර් ජනරාල් හෝ ඉඩම් හා හිමිකම් රෙජිස්ට්‍රාර්ගේ අභිමතය මත පස්වරු 12.00 න් පසුව ඉල්ලීම් කරන අවස්ථාවේදී වුවද පිටපත් ලබා දිය හැකිය.

03. සාමාන්‍ය සේවා යටතේ ලැබෙන අයදුම්පත් පසුදින සවස 3.00 න් පසු දිනක ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ අභිමතය පරිදි <u>නිකුත් කිරීම හෝ තැපැල් කි</u>රීම කළ යුතුය.

04. මුදල් අයකිරීම සම්බන්ධයෙන් ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න. (එක් එක් ගෙවීම සඳහා ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න.)

05. සාමාන්‍ය සේවා යටතේ භාරදෙන ලද අයදුම්පතක් වුවද සේවාලාභියාගේ අවශ්‍යතාවය මත ඉතිරි මුදල (කඩිනම් සේවා ගාස්තුවෙන් සාමාන්‍ය සේවා ගාස්තුව අඩුකර) ගෙවා කඩිනම් සේවාව යටතේ අදාල පිටපත් ලබාගත හැක.

**ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම.**

01. කඩිනම් සේවා හා සාමාන්‍ය සේවා යටතේ අයදුම්පත භාරදීමේදී වෙන වෙනම අයදුම්පත් භාරගැනීමේ ලේඛන හා කුවිතාන්සි පොත් පවත්වා ගෙනයාම.

02. කඩිනම් සේවා අයදුම්පත පෙ.ව. 9.00 සිට 12.00 දක්වා භාර ගැනීම සිදුකළ යුතු අතර ඇටෝර්නි බලපත්‍රය පැය 24ක් තුළදී ලියාපදිංචිය කළ යුතුය .සේවයේ අවශ්‍යතාවය මත සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය යටතේ පස්වරු 12.00 සිට 3.00 දක්වා ඉල්ලුම් කරන අවස්ථාවේදී පසුදින ලියාපදිංචිය ඉටු කිරීම කළ හැකිය.

03. සාමාන්‍ය සේවා යටතේ ලැබෙන ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම වැඩ කරන දින 07කින් පසුව ලියාපදිංචි කර තැපැල් කළ යුතුය.

04. මුදල් අයකිරීම සම්බන්ධයෙන් ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න. (එක් එක් ගෙවීම සඳහා ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න.)

05. සාමාන්‍ය සේවා යටතේ භාරදෙන ලද ලේඛනයක් වුවද සේවාලාභියාගේ අවශ්‍යතාවය මත ඉතිරි මුදල (කඩිනම් සේවා ගාස්තුවෙන් සාමාන්‍ය සේවා ගාස්තුව අඩුකර)ගෙවා කඩිනම් සේවාව යටතේ ලියාපදිංචි කරගත හැක.

**හිමිකම් ලියාපදිංචි කිරීම.**

01. කඩිනම් සේවා හා සාමාන්‍ය සේවා යටතේ පසු ගණුදෙණු භාරදීම සඳහා වෙන වෙනම දිනපොත හා කුවිතාන්සි පොත පවත්වා ගෙනයාම.
02. කඩිනම් සේවා හිමිකම් පසු ගණුදෙණු සාධන පත්‍ර ලියාපදිංචිය පෙ.ව. 9.00 සිට 12.00 දක්වා භාර ගැනීම සිදුකළ යුතු අතර පැය 24ක් තුළදී ලියාපදිංචි කළ යුතුය. සේවයේ අවශ්‍යතාවය මත හිමිකම් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය යටතේ පස්වරු 12.00 සිට 3.00 දක්වා ඉල්ලුම් කරන අවස්ථාවේදී පසුදින ලියාපදිංචිය ඉටු කිරීම කළ හැකිය.
03. සාමාන්‍ය සේවා හිමිකම් පසු ගණුදෙණු සාධන පත්‍ර වැඩ කරන දින 07කින් පසුව ලියාපදිංචිය සිදු කර නිකුත් කිරීමේ කවුළුවෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලබාදිය යුතුය.
04. කඩිනම් සේවා යටතේ අදාළ ලියාපදිංචිය සඳහා හිමිකම් රෙජිස්ට්‍රාර් අනුමැතිය ලබාදිය යුතුය.
05. මුදල් අයකිරීම සම්බන්ධයෙන් ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න. (එක් එක් ගෙවීම සඳහා ඇමුණුම 1හි සඳහන් චක්‍රලේඛය අනුව කටයුතු කරන්න.)
06. සාමාන්‍ය සේවා යටතේ භාරදෙන ලද සාධන පත්‍රයක් වුවද සේවාලාභියාගේ අවශ්‍යතාවය ඉතිරි මුදල (කඩිනම් සේවා ගාස්තුවෙන් සාමාන්‍ය සේවා ගාස්තුව අඩුකර)ගෙවා කඩිනම් සේවාව යටතේ ලියාපදිංචි කරගත හැකිය.
07. පසුගණුදෙනු ලියාපදිංචි කිරීමේදී සාමාන්‍ය සේවා ගාස්තු යටතේ අයකරණ මුදල හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුම් අංක **7041651** දරණ ගිණුමට බැර කරන මෙන්ද කඩිනම් සේවා ගාස්තු යටතේ අයකරණ මුදල රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුම් අංක **7041650** දරණ ගිණුමට බැර කල යුතුය.

**පොදු කරුණු**

ඉහත ගාස්තුන් අය කිරීමේදී කඩිනම් සේවාව යටතේ කරනු ලබන ඉල්ලීම් සඳහා නියමිත කඩිනම් සේවා ගාස්තුව පමණක් අයකරණ මෙන්ද එකී සියළුම ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුම් අංක **7041650** දරණ ගිණුමට බැර කර නිසි පරිදි ප්‍රධාන ගණකාධිකාරී වෙත වාර්තා කරණ මෙන් දන්වමි. තවද කඩිනම් සේවාව යටතේ වැඩ අවසන්වූ ලේඛණයක් නියමිත වේලාවට/දිනට බාරගැනීමට සේවාලාභියා නොපැමිණියහොත් දින 03කට පසු සේවාලාභියාගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

ඉහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කර කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

එන්.සී.විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්

ඇමුණුම 1

## 01. ලේඛණ ලියාපදිංචිය - 117 අධිකාරිය වන ලේඛණ ලියාපදිංචි ආඥාපනතට අදාල කාර්යයන්

පහත වර්ගීකරණය යටතේ ප්‍රමුඛතා ඔප්පු වර්ග හඳුනාගෙන ඇති අතර ඒ සඳහා "කඩිනම් සේවා" යටතේ සංශෝධනය කරනලද කඩිනම් සේවා ගාස්තු පහත පරිදි වේ. කඩිනම් සේවා යටතේ කරනු ලබන ඉල්ලීම් සඳහා පහත සඳහන් ගාස්තු පමණක් අයකරන මෙන් දන්වන අතර සාමාන්‍ය සේවා ගාස්තුන් වෙනස් වී නොමැති බව ද සඳහන් කරමි.

| අනු අංකය | ලියාපදිංචි කල හැකි ඔප්පු වර්ග | කඩිනම් සේවා ගාස්තුව |
|---|---|---|
| 01 | විකුණුම් - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 1,000.00 |
| | ඔප්පුවක අන්තර්ගත වන ඉඩම් උපලේඛණ ගණන 02 ට වැඩි වන අවස්ථාවේදී වැඩිවන එක් උපලේඛණයක් සඳහා ගාස්තුව | රු. 200.00 |
| 02 | නෑගි - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු.1,000.00 |
| | ඔප්පුවක අන්තර්ගත වන ඉඩම් උපලේඛණ ගණන 02 ට වැඩි වන අවස්ථාවේදී වැඩිවන එක් උපලේඛණයක් සඳහා ගාස්තුව | රු. 200.00 |
| 03 | උගස් - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 1,000.00 |
| | ඔප්පුවක අන්තර්ගත වන ඉඩම් උපලේඛණ ගණන 02 ට වැඩි වන අවස්ථාවේදී වැඩිවන එක් උපලේඛණයක් සඳහා ගාස්තුව | රු. 200.00 |
| 04 | ලිපිනය - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 500.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 05 | 47 වගන්තිය - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 500.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 06 | උගස් අවලංගුව - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 500.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 07 | ඇටෝර්නි - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු (ණය උකස්කරයට අදාලව) | රු. 500.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 08 | ඇටෝර්නි අවලංගු කිරීම. - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 500.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 09 | බදු - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 1000.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 10 | බදු අවලංගුව - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 1,000.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |

| | | |
|---|---|---|
| 11 | ගිවිසුම් - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු (විකිණීමේ ගිවිසුම) | රු. 1,000.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |
| 12 | පූර්වතා - ඉඩම් උපලේඛණ 02 ක් දක්වා ස්ථාවර ගාස්තු | රු. 1,000.00 |
| | වැඩි වන එක් උපලේඛණයක් සඳහා | රු. 200.00 |

## 02. 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි පනතේ පසු ගණුදෙනු ලියාපදිංචිය

| අංකය | විස්තරය | කඩිනම් සේවා ගාස්තු (මුදල රු.) |
|---|---|---|
| 1 | විකිණීමේ සාධන පත්‍රය සමග හිමිකම් සහතිකය | 2,500.00 |
| 2 | තෑගි සාධන පත්‍රය සමග හිමිකම් සහතිකය | 2,500.00 |
| 3 | උකස් සාධන පත්‍රය | 1,000.00 |
| 4 | ලිපිනය ලියාපදිංචි කිරිම | 200.00 |
| 5 | බදු සාධන පත්‍රය | 1,000.00 |
| 6 | විකිණීමේ ගිවිසුම් සාධන පත්‍රය | 2,000.00 |
| 7 | ඇටර්නි බලය ලියාපදිංචි කිරීම. | 2,000.00 |
| 8 | ඇටර්නි බලය අවලංගු කිරීම. | 1,000.00 |
| 9 | අතුරු බෙදීමේ සාධන පත්‍රය ලියාපදිංචි කිරීම. (එක් ඉඩමක් සඳහා ලි. ගාස්තු) නව සහතිකයට - රු. 500/- බැගින් | 2,500.00 |
| 10 | කේවියට් තහනම (මාස 6 කට) | 1,000.00 |
| 11 | පූර්වතා දැන්වීම | 1,500.00 |
| 12 | ජීවිත භුක්තිය පැවරීමේ සාධන පත්‍රය | 1,000.00 |
| ~~13~~ | ~~විකුණුම් සහතික සාධන පත්‍රය~~ | ~~1,500.00~~ |
| 14 | හිමිකම් රෙජිස්ටරයක් (උද්ධෘත පිටපතක්) ලබාගැනීම සඳහා | 500.00 |
| 15 | හිමිකම් රෙජිස්ටරය පරීක්ෂා කර බැලීම සඳහා | 250.00 |
| 16 | හිමිකම් සහතිකයේ පිටපතක් ලබා ගැනීම සඳහා | - |
| 17 | අවලංගු කිරීමේ සාධන පත්‍ර (උකස්/ බදු/ කේවියට්/ ජී. භුක්තිය/ වි. ගිවිසුම් | 1,000.00 |
| 18 | සාධන පත්‍ර පිටපතක් ඉල්ලුම් කිරීම සඳහා | 500.00 |
| 19 | හිමිකම් පනත යටතේ පනවා ඇති වෙනත් සාධන පත්‍ර | 1,000.00 |
| 20 | වෙනත් පනත් මගින් ප්‍රකාශයට පත්කර ඇති හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කළ හැකි වෙනත් සාධන පත්‍ර | 1,000.00 |

3. ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ ආඥාපනතට (122 අධිකාරිය) අදාළ කාර්යයන්

| අනු අංකය | විස්තරය | කඩිනම් සේවා ගාස්තු (මුදල රු.) |
|---|---|---|
| 01 | ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචිය | රු.2500.00 |
| 02 | ඇටෝර්නි බලපත්‍ර සහතික පිටපත් | රු.1000.00 |
| 03 | ඇටෝර්නි බලපත්‍ර උධෘත පිටපත් | රු.1000.00 |

4. ඉඩම් ලේඛන උධෘත පිටපත්, ඔප්පු පිටපත්,හිමිකම් සහතික උධෘත පිටපත්,හිමිකම් සහතික සාධනපත්‍ර සහතික පිටපත් නිකුත්කිරීම.

| අනු අංකය | විස්තරය | කඩිනම් සේවා ගාස්තු (මුදල රු.) |
|---|---|---|
| 01 | ඉඩම් ලේඛන උධෘත පිටපත්(පත් ඉරු) | රු.200.00 |
| 02 | ඔප්පු සහතික පිටපත් | රු1000.00 |
| 03 | හිමිකම් සහතික උධෘත පිටපත් | රු.500.00 |
| 04 | හිමිකම් සහතික සාධන පත්‍ර පිටපත් | රු.500.00 |

එන්.සී.විතානගේ.
රෙජිස්ට්‍රාර් ජනරාල්.